# HUMAN RESOURCE MANAGEMENT (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# මානව සම්පත් කළමනාකරණය

සංවිධානයක පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා වඩා යෝග්‍ය හා තෘප්තිමත් මානව සම්පත් ජනිතවන අයුරෙන් ආයතනයේ මානව සම්පත සඵලදායි ව හා කාර්යක්ෂම ව ලබා ගැනීම හා රඳවා ගැනීම සම්බන්ධ ක්‍රියාකාරකම් සමුදාය මානව සම්පත් කළමනාකරණය ලෙස හැඳින්විය හැකි ය.

# සෙසු සම්පත්වලට සාපේක්ෂව මානව සම්පතෙහි දැකිය හැකි සුවිශේෂතා

- සජීව සම්පතක් වීම.
- සිතීමට හා ප්‍රතික්‍රියා දැක්වීමට හැකි වීම.
- සෙසු සම්පත් පාලනය කළ හැකි වීම.
- පුහුණු කිරීමෙන් අගය වැඩි වීම.
- කණ්ඩායම් වශයෙන් කටයුතු කළ හැකි වීම.

ClassWork.LK

- චර්යා සංකීර්ණ වීම හා පුරෝකථනය කළ නොහැකි වීම.
- නිර්මාණාත්මක හැකියා සහිත වීම.

## <u>මානව සම්පත් කළමනාකරණයේ පොදු පරමාර්ථ</u>

සංවිධානයේ සාර්ථකත්වය සඳහා උපරිම දායකත්වයක් ලබා දෙන යෝග්‍ය හා තෘප්තිමත් සේවාදායකයන් ඇති කර ගැනීම හා රඳවා ගැනීම.

## <u>මානව සම්පත් කළමනාකරණයේ සුවිශේෂ අරමුණු</u>

- සේවක ඵලදායීතාව වර්ධනය කිරීම.
- සේවක කැපවීම නංවාලීම.
- සේවක සංවර්ධනය ඇති කිරීම.

ClassWork.LK

- සේවක අභිප්‍රේරණය කිරිම.
- සේවක සුභසාධනය.
- රැකියා සඳහා නියමිත වේලාවට නිවැරදි ප්‍රමාණයෙන් නිවැරදි සේවකයන් බඳවා ගැනීම.
- වඩාත් යෝග්‍ය සේවකයන් ආයතනයේ රඳවා ගැනීම.
- යහපත් කාර්මික සම්බන්ධතා පවත්වාගෙන යාම හා වර්ධනය කිරිම.
- සේවා නියුක්ත පිරිවැය පාලනය කිරිම (වැටුප්, අතිකාල, බඳවා ගැනීමේ පිරිවැය, ඉවත් කිරීමේ පිරිවැය )
- මානව සම්පත සම්බන්ධයෙන් වන සංවිධානයේ සමාජීය හා නෛතික වගකීම් ඉටු කිරීම

ClassWork.LK

# මානව සම්පත් කළමනාකරණයේ වැදගත්කම

- අනෙකුත් සම්පත්වලට සාපේක්ෂව මානව සම්පත සප්‍රාණික වන නිසා මානව සම්පතට සිතීමට, හැඟීමට, දැනීමට සහ ප්‍රතික්‍රියා දැක්වීමට හැකියාවක් ඇත.

- අනෙකුත් සියලු ම සම්පත් පිළිබඳ තීරණ ගනු ලබන්නේ මානව සම්පත නිසා ආයතනයේ වැදගත් ම එමෙන් ම වටිනාම සම්පත මානව සම්පත වීම.

- ව්‍යාපාර ආයතනයකට දිගු කාලීනව තරඟකාරී වාසි ලබා ගැනීමටත්, ව්‍යාපාරය නොනැසී පවත්වාගෙන යාමටත් යොදා ගත හැකි එකම තීරණාත්මක සාධකය මානව සම්පත වීම.

- මානව සම්පත් කළමනාකරණය සමස්ත සමාජයේ ම ශුභසිද්ධිය සඳහා ඉතා වැදගත් වීම.

ClassWork.LK

- මානව සම්පත් කළමනාකරණය මානව සම්පත් කළමනාකරුගේ වගකීමක් පමණක් නොවන අතර එය ආයතනයේ සියලු ම කළමනාකරුවන්ගේ සාමූහික වගකීමක් වීම.

- නූතන ව්‍යාපාරික පරිසරය තුළ වෘත්තීය ආරවුල් හා ගැටුම් විශාල ලෙස වර්ධනය වී තිබීමනිසා ආරවුල් හා බගැටුම් විසඳීමේ දී මානව සම්පත් කළමනාකරණයට විශාල කාර්යභාරයක් හා ඉටු කිරීමට හැකි වීම.

ClassWork.LK

# <u>මානව සම්පත් කළමනාකරණ ශ්‍රිතයට අයත් කාර්ය</u>

- රැකියා නිර්මාණය - Job Design
- රැකියා විග්‍රහය/ විශ්ලේෂණය - Job Analysis
- මානව සම්පත් සැලසුම්කරණය - Human Resource Planning
- ආකර්ෂණය - Recruitment
- තෝරා ගැනීම - Selection
- බඳවා ගැනීම - Hiring / Appointment
- අනුස්ථාපනය - Induction
- සංවේතන කළමනාකරණය - Compensation Management

ClassWork.LK

- කාර්යඵල ඇගයීම/කාර්යඵල - Performance Appraisal / Performance
- කළමනාකරණය - Management
- පුහුණුව හා සංවර්ධනය - Training & Development
- සේවාදායක චලන - Employee Movements
- විනය කළමනාකරණය - Diciplinary Management
- සෞඛ්‍ය හා ආරක්ෂාව පරිපාලනය - Heath & Safety Administration
- දුක්ගැනවිලි නිරාකරණය - Grievances Handling
- කාර්මික සම්බන්ධතා - Labour Relations

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura